

# අම්පිටියේ සිරි රාහුල මාහිමි උපත්
# සියවස් ආසී කලබ

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **56 වන කාණ්ඩය** | **බු.ව.2557 උඳුවප් මස පුරපසළොස්වකදා ක්‍රි.ව.2013 දෙසැම්බර මස 16 වන දා** | **08 වන කලබ** |

## අඤ්ජලිකරණී



පින්සර සිල් සුවඳින් සුළකල්
පුල්සර තුල් ගුණයෙන් සුවිපුල්
අම්පිටියේ සිරි රාහුළ මාහිමි
මෙහෙය අමරණීය ව සුදිලේ
සුවඳ දිදී ලක් සසුන් විලේ

සිය වස් කල් තුළ සුපිපි කුසුම ඔබ
විදුරු අරම් මඟ මැනැවින් කළ පොබ
කළ මහ මෙහෙවර සසුනට මැයි සුබ
උදු සඳ යි හිමි සඳ සාසන නුබ !

ගුරු දෙවියාණන් ගුණ මකරන්දේ
මිහිර විඳිමු නිති සුසුදු සුගන්දේ
සිහි කරනෙමු කළ මෙහෙය නිබන්දේ
බැති පුද පා හිමි පාදේ වන්දේ

**අනඳ**



# කල්‍යාණ මිත්‍රයා

**අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි**

**මිජ්ජති තායති චාති මිත්තෝ** යනු මෛත්‍රී සූත්‍රාර්ථ කථා හෙයින් ප්‍රේමත් කෙරෙයි ආරක්ෂාත් කෙරෙයි යනු මිත්‍ර නම් වේ, කෙසේ ප්‍රේම කෙරේ ද? කෙසේ ආරක්ෂා කෙරේ ද ? යන ප්‍රශ්නයෙහි '' **හිතජ්ඣාසයතාය සිනිය්හති අහිතාපගමතො රක්ඛති චාති අත්ථො**'' යනු අටුවාහි ආ විසඳීම යි. වැඩ සලසන අදහස් ඇති බැවින් ප්‍රේමත් කෙරෙයි. ඇවැඩෙන් වළක්වන බැවින් ආරක්ෂාත් කෙරෙයි යනු එහි භාව යි.

මෙසේ යහපත සලසන්නා වූත් අයහපතින් වළක්වා ආරක්ෂා කරන්නා වූත් තැනැත්තේ මිත්‍ර නම් වේ.

මෙලෝ පරලෝ යහපත සලසා ගැනීමටත් පිරිසුදු ප්‍රීතියටත් සැනැසිල්ලටත් සසර දුකින් මිදීමටත් මිත්‍රයෝ වුවමනා ම වෙති. එහෙයින් බුදුරජාණන් වහන්සේ පවා ''**දුක්ඛං ඛො අගාරවො විහරති**'' යනුවෙන් තමන්ගේ ආශ්‍රයට නිසි කල්‍යාණ මිත්‍ර ගුරු කෙනෙකුන් නැති වාසය කෙතරම් තැනැත්තකුට වුවත් දුක්ඛ වාසයෙක් ම යයි සලකා තමන් වහන්සේට වැඩියක්හු තබා සම වූ

තැනැත්තකුත් තුන් ලොව ම නැති බැවින් තමන් වහන්සේ විසින් ම අවබෝධ කර ගන්නා ලද සපර්යාප්තික නවලෝකෝත්තර ධර්මය ම තමනට ගුරුතන්හි තබා සාදරයෙන් සැලැකූ සේක.

දිනක් අනඳ මාහිමියන් වහන්සේ 'මේ බුදුසස්නෙහි දියුණුවෙන් අඩක් ම (භාගයක් ම) කල්‍යාණමිත්‍රයන් ඇති බැවින් ලැබේ' යයි කී කල බුදුරජාණන් වහන්සේ **''මා හේ'වං ආනන්ද, මා හේ'වං ආනන්ද, සකලමේ'ව හිදං ආනන්ද, බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණ මිත්තතා''** යනාදීන්, ආනන්ද, එසේ නො කියව, මේ සාසනයෙහි හැම දියුණුවක් ම සැලසෙන්නේ කල්‍යාණ මිත්‍රයන් නිසා ම බව වදාළ සේක.

**අසේවනා ච බාලානං පණ්ඩිතානං ච සේවනා** - අට තිසක් මංගල හෙවත් දෙලෝ දියුණුව සලසන කරුණු අතුරෙන් මුල් යුවළ පාපමිත්‍ර වර්ජනය හා කල්‍යාණ මිත්‍ර සේවනය බව මහා මංගල සූත්‍රයෙහි සඳහන් ව ඇත.

මේ කල්‍යාණ මිත්‍රතාව සෝතාපත්තියංග හෙවත් සෝවාන් වීමට හේතුවන කරුණු සතරින් එකක් හැටියට ද, මෙ ලොව දියුණුවට උවමනා උට්ඨාන සම්පදා ආදි කරුණු සතරින් එකක් හැටියට ද, බුදුසවුවකු සනාථ පුද්ගලයකු බවට පත් කරන නාථකරණ ධර්ම දසයෙන් එකක් හැටියට ද භික්ෂූන් උදෙසා වදාළ අපරිහානීය ධර්ම හෙවත් දියුණුවට අදාළ කරුණු සතෙන් එකක් හැටියට ද දක්වා තවත් නොයෙක් ගුණ සමූහයන්හි අංග කොටත් උගන්වා තිබේ.

කල්‍යාණ මිත්‍රයා වනාහි ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත (බණඋගත්කම) ත්‍යාග (අත්හැරීම) වීර්‍ය, සති, සමාධි,

ප්‍රඥා යන ගුණයන්ගෙන් යුක්ත වූයේ වේ. සැදැහැ ඇතියේ තථාගතයන් වහන්සේ ගේ බෝධි ඥානය අදහයි. එහෙයින් සම්‍යක් සම්බෝධියට හේතු වූ සත්ත්වයන් කෙරෙහි හිතවත් බව අත් නො හරියි. එබැවින් ම සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ම සර්වාකාර සම්පූර්ණ කල්‍යාණ මිත්‍ර වන සේක.

**පියෝ ච ගරු භාවනීයෝ - වත්තා ච වචනක්ඛමො**
**ගම්භීරං ච කථං කත්තා - නොච'ට්ඨානෙ නියෝජයේ**

සිල්වත්වූයේ සබ්‍රම්සරුනට (එකට මහණදම් පුරන මහණුනට) ප්‍රිය වේ. ගරු සම්භාවනීය වේ. වැරදි කියා දෙන්නෙක් වේ. පවට ගර්හා කරන්නෙක් වේ. මෙරමාට අවවාද දෙන්නෙක් වේ. එසේ ම අවවාද පිළිගන්නෙක් ද වේ. ශ්‍රැත සම්පත්තිය හේතු කොට ගෙන ස්කන්ධ ධාතු ආයතන සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදදී ගැඹුරු දහම් කියන්නෙක් වේ. ත්‍යාග සම්පත්තිය හේතු කොට ගෙන අල්පේච්ඡ වේ. සතුටින් වසයි. විවේකයට කැමැති වේ. සංසර්ගයෙන් පහවූයේ වේ. වීර්යය **සම්පත්තිය හේතු කොට ගෙන තමාගේත්** මෙරමාගේත් හිතසුව පිණිස වීර්යය වඩන්නෙක් වේ. ස්මෘති සම්පත්තිය හේතු කොට ගෙන දිගු කලක් කළ කී දෑ සිහි කරමින් නිති එළඹ සිටි සිහි ඇත්තෙක් වේ. සමාධි සම්පත්තිය හේතු කොට ගෙන අවික්ෂිප්ත සිතැත්තෙක් වේ. සමාහිත වූයේ වේ. එකඟ සිතැත්තෙක් වේ. ප්‍රඥා සම්පත්තිය හේතු කොට ගෙන ඇති තතු ඇති හැටියට දකී. යථා තත්ත්වය දැන ගනී.

මේ ශාසනයෙහි ත්‍රිපිටක ධර්මය ඉගෙනීම නම් වූ පර්යාප්ති සම්පත්තිය ද ඒ වූ පරිදි පිළිපැදීම නම් වූ

ප්‍රතිපත්ති සම්පත්තිය ද, ඒ ප්‍රතිපත්තියෙන් ලැබිය යුතු වූ නව ලොවුතුරා දහම් (සතර මඟ සතර පල හා නිවන්) නම් වූ ප්‍රතිවේධ සම්පත්තිය ද යන මේ සියලු දියුණුවක් ම සැලැසෙන්නේ කල්‍යාණ මිත්‍ර සේවනය නිසා ම ය.

**''ව්‍යාධිතස්‍යාර්ථහීනස්‍ය - දේශාන්තරගතස්‍ය ච**
**නරස්‍ය ශොකදග්ධස්‍ය - සුහෘද් දර්ශන'මෞෂධම් ''**

ගිලන් ව දුකින් සිටින්නහුට ද, ධන හානියට පැමිණ සිටින්නහුට ද, සිය දෙසින් වෙන පළාතකට ගිය තැනැත්තකුට ද, යම් කිසි ශෝකාග්නියකින් දැවුණු සිත්සතන් ඇත්තකුට ද මිත්‍රයකු දක්නට ලැබීම ඒ හැම දුක් ලෙඩ සැනැසීමට කදිම බෙහෙතකැයි කීහ.

සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් පරිදි කල්‍යාණ මිත්‍රයෝ සතර දෙනෙකි.

**1. උපකාරක මිත්‍රයෝ ය 2. සමාන සුඛදුඃඛ මිත්‍රයෝ ය**

**3. අර්ථඛ්‍යායී මිත්‍රයෝ ය 3. අනුකම්පක මිත්‍රයෝ ය**

**උපකාරක මිත්‍රයෝ නම් :** වුවමනා තැන දී නො මසුරු ව, නො පැකිල උපකාර කරන යහළුවෝ ය.

01. නො සැලැකිල්ලෙන් කල් යවන යහළුවා රැකබලා ගැනීම ය.
02. ඔහු සතු දේ රැකෙන සැටි සලසා දීම ය.
03. යම් බියක් පැමිණි කල යහළුවා සනසා ඒ බියෙහි දී පිහිට වීම ය.
04. යම් යම් කටයුතු පැමිණි කල්හි ඒ ඒ කටයුත්ත පිරිමසා ගත නොහී පසු බස්නා මිතුරා සනසා වුවමනා පමණටත් වඩා ආධාර කිරීම ය.

යන මේ සතර උපකාරක මිත්‍රයාගේ ලකුණු යි.

**සමාන සුඛදුඃඛ මිත්‍රයෝ නම්** : සුව දුක් දෙකෙහි සම ව හිතවත් ව කල් යවන යහළුවෝ ය.

01. තමාගේ රහස් නො සඟවා ඔහුට කියන බව ය.

02. ඔහුගේ රහස් පිටත නො කියා රක්නා බව ය.

03. විපත්තීන්හි දී අත හැර නො යන බව ය.

04. යහළුවා පිණිස තමාගේ ජීවිතය වුවත් පුදන බව ය යන මේ සතර සමාන සුඛදුඃඛ මිත්‍රයාගේ ලකුණු යි.

**අර්ථඛ්‍යායී මිත්‍රයෝ නම්** : දෙලොව දියුණුවට මඟ කියා දෙන යහළුවෝ ය.

01. නපුරෙන් (පවින්) වළක්වාලීම ය.

02. යහපතෙහි යොදවා ලීම ය.

03. නො ඇසූ දෑ ඇස්වීම ය හෙවත් පෙර නො ඇසූ නොදත් ආගම ශාස්ත්‍රාදිය අසන්නට දැන ගන්නට සැලැස්වීම ය.

04. සුගතියට (හොඳ උත්පත්තියකට) මඟ කියා දීම යන මේ සතර අර්ථඛ්‍යායී මිත්‍රයාගේ ලකුණු යි.

**අනුකම්පක මිත්‍රයෝ නම්** : අනුකම්පා කරන ස්වභාවය ඇති යහළුවෝ ය.

01. යහළුවාගේ පිරිහීමකින්, ඔහුට වූ විපතකින් සතුටු නොවන බව ය.

02. ඔහුගේ දියුණුවකින් තමහට වූවක් මෙන් සිතා ඊර්ෂ්‍යා නො කොට ප්‍රීති වීම ය.

03. ඔහුගේ දෙස් කියන්නකු හමු වුවහොත් එය වළක්වා නිදෙස් කොට දක්වීම ය.

04. ගුණ කියන්නකු හමුවුව හොත් ඉතා මැනැවැයි ඔහුට ප්‍රශංසා කිරීම ය. යන මේ සතර අනුකම්පක මිත්‍රයා ගේ ලකුණු යි.

**''උපකාරො ච යො මිත්තො - යො ච මිත්තො සුඛෙ දුඛෙ**
**අත්ථක්ඛායී ච යො මිත්තො - යො ච මිත්තානුකම්පකො**
**එතෙ බො මිත්තෙ චත්තාරො - ඉති විඤ්ඤාය පණ්ඩිතො**
**සක්කච්චං පයිරුපාසෙය්‍ය - මාතා පුත්තං'ව ඔරසං ''**

නුවරණැත්තේ උපකාරක, සමානසුඛදුඃඛ, අර්ථාඛ්‍යායී, අනුකම්පක යන මේ මිත්‍රයන් සතර දෙන ගැන දැන ගෙන මවක සිය දරුවා ඇසුරු කරන්නාක් මෙන් සකසා සේවනය කරන්නේ ය.

තමාගේ දියුණුවක් බලාපොරොත්තු වන්නකු විසින් මෙකී සොළොස් ලකුණින් යුත් කලණ මිතුරන් ම සේවනය කටයුතු ය.

හොඳට හැදුණු වැඩුණු උදර පුරුෂයන් විසින් පවිටු නරක මිනිසුන් ඔවුන් හොඳ මිනිසුන් කරන අටියෙන් අනුකම්පාවෙන් ආශ්‍රය කටයුතු බව මහාකාරුණික වූ බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

### මිත්‍ර ලක්ෂණය

වෙන් ව වසන්නා වූ මිත්‍රයා සිහි කිරීම, ආ විට දැක සතුටුවීම, ඉක්බිති ඔහුට ඇඟැලුමක් දැක්වීම, ප්‍රිය වචනයෙන් පිළිසඳර කථා කිරීම, මිතුරාගේ මිතුරන් ම භජනය කිරීම, සතුරන් භජනය නො කිරීම, ආක්‍රෝශ

කරන්නවුන් වැළැක්වීම, ගුණ කියන්නවුන්ට පැසැසීම, තමාගේ රහස් මිතුරාට කීම. මිතුරාගේ රහස් සැඟවීම. ඔහුගේ වැඩවල ගුණ කීම. නුවණට පැසැසීම. මිතුරාගේ දියුණුවට සතුටුවීම. පිරිහීමට නො කැමැති වීම. ආශ්චර්යවත් භෝජනයක් ලැබුණු විට සිහි කිරීම. 'අහෝ මාගේ යහළුවාත් මෙයින් කොටසක් ලබන්නේ නම් හොඳ'යයි අනුකම්පා සහගත වීම යන මේ කරුණු සොළොසින් යුක්ත වූයේ සැබෑ මිතුරෙකි.

යමෙක් මිතුරා හට දීමට දුෂ්කර වූ අගනා දෙය දේ ද, මිත්‍රයා වෙනුවෙන් දුෂ්කර දෑ කෙරේ ද, මිත්‍රයා විසින් කියවුණු ඉවසීමට දුෂ්කර වචන වුව ද ඉවසා ද, විපත්වලදී නො හරී ද, වස්තුව හීන වී ගිය කල (දුප්පත් වූ කල) පහත් කොට නො සිතා ද, යන මේ කරුණු උදාර අදහස් ඇති හොඳ මිත්‍රයකු ගේ ලක්ෂණයෝ වෙති.

**නෙරපන කල්හි ද නො හළ යුතු කල්‍යාණ මිත්‍රයා** - යම් මිත්‍රයෙක් ප්‍රිය වේ ද, ගරු කටයුතු වේ ද, බුහුමනට සුදුසු වේ ද, කටයුත්ත නො කටයුත්ත කියා දීමෙහි සමත් වේ ද, අවවාද පිළිගන්නේ වේ ද, ගැඹුරු කථා කියන්නේ වේ ද, ආශ්‍රය කරන්නා නොමඟ නො යොදවන්නේ වේ ද, මේ කරුණු සත යම් පුද්ගලයකු කෙරෙහි ඇත්තේ ද, අර්ථය (දියුණුව) කැමැත්තා වූ අනුකම්පා කරන්නා වූ ඒ මිත්‍රයා මිත්‍රයන් කැමැති වන්නාහු විසින් නෙරපනු ලබන කල්හි ද අත් නො හැර භජනය කට යුතු ය.

බාල වයසේ දී ම ළමයිනට කල්‍යාණ ගුණ ඇතියවුන් ම ඔවුන්ගේ මිතුරන් හැටියට සලසා දීම මවුපියන්ගේ වැඩිහිටියන් ගේ යුතුකමෙකි.

**මාතා මිත්තං සකෙ ඝරෙ** යී වදාළ පරිදි ළමා කල්හි, ගෙයි ඇති දැඩි වන කල්හි, පරම මිත්‍රයා නම් (හැමට ම උසස් හිතවතා නම් ) මෑණියෝ ය. ඊ ළඟ හිතවතා නම් පියාණෝ ය. ඊ ළඟට මිතුරෝ ගුරුහු වෙති. ඔහු ද මවුපියන් මෙන් නියම ගුරුතන්හි සිටි කල්හි ම මිතුරෝ ය. නැත හොත් සතුරෝ ය.

ගෘහපතියකු වූ කල ''**භරියාච පරමො සඛා** '' යී වදාළ පරිදි ස්වකීය භාර්යාව ම හැමට උසස් මිත්‍රයා වේ. එසේ වන්නේ මාතුභරියා, භගිනිභරියා, සඛී භරියා හා දසී භරියා යන සතර හොඳ බිරියන්ගෙන් එක් බිරියක වුවහොතින් ම ය. වධක භාර්යාදී නපුරු බිරියක් වී නම් පරම සැතිරියකි.

හැමට වැඩි මිතුරා නම් තම හට හිතවත් වූ තෙමේ ම ය. ඔවුහු තම හට දෙලොවින් ම වැඩ සැලැසෙන සේ කල් යවන්නෝ යි. පරලොව දී මිත්‍රයෝ නම් තම තමා විසින් කරගත් පින් දහම් හෙවත් පුණ්‍ය ක්‍රියාවෝ ය.

තමන් උපන් රටට ජාතියට හිතවත් වූවෝ, වැඩ සලසන්නෝ, දේශප්‍රේමීහු ස්වදේශ මිත්‍රයෝ ය. මුළු ලොව මිනිස් නොමිනිස් හැම සත්ත්ව වර්ගයාට ම වැඩ සලසන බුදුවරු බුදුසවුවෝ (බුද්ධ ශ්‍රාවකයෝ) සර්වලෝක මිත්‍රයෝ ය. මුළු ලොවට ම මෙත් වඩන්නෝ ය. හිතවත්හු ය.

මෙසේ මිත්‍ර ප්‍රභේද රාශියකි.

**''පාපාන් නිවාරයති යොජයතෙ හිතාය**
**ගුහ්‍යඤ්ච ගූහති ගුණාන් ප්‍රකටී කරොති**
**ආපද්ගතඤ්ච න ජහාති දදාති කාලෙ**
**සන්මිත්‍ර ලක්ෂණ'මිදං ප්‍රවදන්ති සන්තඃ**

(අවැඩෙනි වැළකීමත් - යාපතේහී යෙදීමත්
ගුණ හෙළි කොට කීමත් - නෙක් රහස් දෙස් නොපැමත්
විපතෙහි නොහැරීමත් - කල්හි දීමත් රිසී දෑ
සුමිතුරු ලකුණු වෙත් - යී කියත් සත් ගුණැත්තෝ )

**න සො මිත්තො යො සදා අප්පමත්තො**
**භෙදානුසංකී රන්ධ මෙවානුපස්සී**
**යස්මිං ච සෙති උරසීව පුත්තො**
**ස වෙ මිත්තො යො අභෙජ්ජො පරෙහී ''**

යමෙක් නිතොර ම යහළුවා ගැන සැකයෙන් සිදුරු ම සොයා ද, හෙතෙමේ මිත්‍රයෙක් නොවේ. මවගේ ළයෙහි දරුවෙකු නිදන්නාක් මෙන් යමකු ළඟ සයනය කෙරේ ද, අනුන් විසින් නො බිඳවිය හැක්කා වූ හෙතෙමේ ඒකාන්ත මිතුරා නම් වේ.

**''මුඛං ප්‍රසන්නං විමලා ච දෘෂ්ටිඃ**
**- කථානුරාගො මධුරාව වාණී**
**ස්නෙහොධිකං සම්භ්‍රමදර්ශනඤ්ච**
**- සදනුරක්තස්‍ය ජනස්‍ය ලක්ෂණම්''**

පැහැදුනු සතුටු මුහුණ, පිරිසිදු බැල්ම, කථාවෙහි ඇලුණු බව, මිහිරි වචන කථා කිරීම, අධික ස්නේහය, නැවත නැවත ආදරයෙන් බැලීම යන මේ ගුණ හැම කල්හි ඇලුණා වූ ජනයාගේ ලක්ෂණයෝ වෙති.



# ශ්‍රී රාහුල මහාස්ථවිරාශීර්කුසුමම් !

ශ්‍රී ලංකා අමරපුර මහානිකායයේ උත්තරීතර මහානායක ධුරීණ, සංස්කෘත භාෂා චක්‍රවර්ති, ශ්‍රී සුමංගල විද්‍යාවතංස, අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය දවුල්දෙණ ඤාණිස්සර මහානායක මාහිමිපාණන් වහන්සේ විසිනි

**සම්බුද්ධශාසනසරොජවරෙ විකාශී**
**සංශුද්ධ ශීලගුණවාසනපඞ්කජාභඃ**
**ශ්‍රී රාහුලො යතිවරො'ම්පිටියෙ'භිජාතො**
**රත්නත්‍රයස්‍ය ශරණෙන චිරං විරාජෙත්**

සම්බුදු සසුන නමැති උතුම් විලෙහි විකසිත වූ, සුපිරිසිදු ශීල ගුණ වාසනා ඇති පියුමක් බඳු වූ, අම්පිටිය නම් ගම් පියසෙහි උපත ලද ශ්‍රී රාහුල මහා යතිවරයන් වහන්සේ තුනුරුවන් සරණින් බොහෝ කල් විරාජමාන වෙත් වා !

**ප්‍රඥශීල ප්‍රභාභිර් ජනකුමුදවනං භූෂයන්නින්දුවද් යො**
**විද්‍යාශාස්ත්‍ර ප්‍රවීණඃ ප්‍රවචනජලධෙඃ පාරතීරං ප්‍රපන්නඃ**
**ශ්‍රී වජ්‍රඥනනෙතා සුරගුරු සදෘශො ග්‍රාමවයෛා පැලෑනේ**
**තච්ඡිෂ්‍යො රාහුලො'භූද් ගුරුරිව මතිමාන් ශාසනෙ භක්තචෙතාඃ**

ප්‍රඥාව හා ශීලය නමැති ආලෝකයෙන් ජනතාව නමැති කුමුදු වනය බබළවන්නා වූ චන්ද්‍රයා හා සමාන වූ යම් කෙනෙක් විද්‍යා ශාස්ත්‍රයන්හි ප්‍රවීණ ව ත්‍රිපිටක බුද්ධ වචනය නමැති මුහුදෙහි පරතෙරට පත් වූවාහු ද, ඒ පැළෑණේ ශ්‍රී වජ්‍රඥාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දිව ගුරුන් හා සමාන වූහ. ඇදුරුතුමන් මෙන් පැනවත් වූ සසුනෙහි බැති සිත් ඇති රාහුල ස්වාමීන් වහන්සේ එතුමන් වහන්සේ ගේ ශිෂ්‍ය වූවෝ ය.

**නින්දකීර්තිප්‍රශංසා නභසි ජලමුචාං ගර්ජනාවද් විගණ්‍ය**
**ලාභාලාභාපවාදං තෘණමිව ගණයන්නෙෂ මධ්‍යස්ථචෙතාඃ**
**ව්‍යසෙය්‍යාපක්ලෙශජාලං මනසි පරිණතං මානදර්පාභිමානං**
**සංසාරාබ්ධිං තිතීර්ෂුඃ ප්‍රවරයතිවරඃ ප්‍රේක්ෂතෙ ධර්මනාවම්**

නින්ද කීර්ති හා ප්‍රශංසා අහසෙහි ගුගුරන මේඝ ගර්ජනාවක් තරම් වත් නො සලකා, ලාභ අලාභ සහ අපවාද තණ පතක් තරම් හෝ නො තකා, මැදහත් සිත් ඇති ව, මනසෙහි වැඩෙන මාන-දර්ප-අභිමාන ආදි උපක්ලේශ ජාලයන් තුනී කොට, මේ උතුම් යතිවරයාණන් වහන්සේ සසර සයුරින් එතෙර වනු කැමැති ව ධර්මය නමැති නෞකාව වෙසෙසින් සොයන සේක.

**ගුණෙන තපසා වයසා වෘද්ධො ජාත්‍යා ශතවර්ෂී**
**ලොකාලොකං කුර්වන් යශසා භ්‍රමයන් ධර්මෝත්තමචක්‍රම්**
**මුනිවරශාසන වෘද්ධිං නෙයං නෙයං පුනරපි ශතවර්ෂං**
**ජීව්‍යාජ්ජීව්‍යාදම්පිටියේ යති රාහුලනෙතා නිරාමයං**

ගුණයෙන් තපසින් වයසින් වෘද්ධ ව උපතින් සිය වස් ඇතිව, කීර්තිමත් ව, උතුම් දම්සක් පවත්වමින් (ධර්මය දේශනා කරමින්) ලෝකය ආලෝකවත් කරමින් සම්බුද්ධ ශාසනයේ දියුණුව සලසමින් වැඩ සිටින ගෞරවාර්හ අම්පිටියේ ශ්‍රී රාහුල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නිදුක් ව තව ද සියවස් කල් වැඩ වෙසෙත්වා !



නිහීයති පුරිසෝ නිහීනසේවී
න ච හායේථ කදාචි තුල්‍යසේවී
සෙට්ඨමුපනමං උදේති ඛිප්පං
තස්මා අත්තනෝ උත්තරිං භජේථ

තම හට පහත් අය සෙවුනේ පිරිහෙන්නේ
සම අය සෙවුනෙ එම තතුයෙන් නොම හෙන්නේ
සැමතින් වැඩේ උතුමකු සෙවනට යන්නේ
තම හට වැඩියකු ම බජනේ එබැවින්නේ



# සෝම හිමියනි !

## අතිගරු ගංගොඩවිල සෝම ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ අපවත් ව දස වසක් පිරේ



කුස නුබ දිදුල සඳ සේ සල කිරණ සොමි
ඇස ඇස සුනිල රුව, ඍදි හළ සසර බැමි
සස ලවු දනගෙ සිත් නිවු, පව් කෙරෙහි නැමි
දස වසරක් ය අපවත් වී සෝම හිමි

බුදුබණ ගැඹුරුමුත් නොගැඹුරු ලෙසින් දෙසූ
මුදු ගුණ සිත් පිරූ ඒ දම් හඬින් ඇසූ
හුදු දන සතන් නිවූ හිමි වැඩ සිටිය විසූ
කඳුළක් වැටේ අද වුව, ඒ යුගෙන් පසූ

ඇඳහිලි වල රැඳී පූජා කරන බිලී
සැළකිලි පුද දිදී දෙවියො යදින ගැලී
හුලු එළියකින් වත් ලොව දක ගන්න මැලී
හිමි හෙළි කළා මහ දන හට අඳුරෙ වෙලී

හැම බණ පදයක් ම මනසට සිසිලක් ය
සුමඟට සැවොම ගෙන යන මං තලයක් ය
තම තම නැණ පමණ දත යුතු කරුණක් ය
නිම වෙන තුරුම සංසාරය ගින්නක් ය

ගම් සිය දහස් දුරකට ඔබ වැඩියේ ය
සිවු දෙස දනග ඉන් සැනසුම දිවියේ ය
සිවු සිත නිබඳ රැඳුණේ බුදු කුටියේ ය
දෙව්දත්වරුන් බුදු හිමිටත් සිටියේ ය

සියවසරක් ගිය ද හිමියනි! ඔබැ නික්ම
ලිය වුණු මතක සිහි වේ හැමැ මොහොතක්ම
නියදම අනුව සිදු විය හැක කරුණක්ම
පිය සටහන් සොයමි! යළි හිමි එන කම්ම

**ඩබ්ලිව්. කේ. සරත් විමලසිරි කිවියාණන් විසිනි**



# අම්පිටියේ ශ්‍රී රාහුල මහා ස්වාමීන් වහන්සේගේ උදාර පැවිදි ජීවිතය

**සාහිත්‍යසූරි ආචාර්ය එච්. ඒ.පී. අභයවර්ධන මහතා විසිනි**

2013 වසරේ දෙසැම්බර මස 25 දිනට අම්පිටියේ ශ්‍රී රාහුල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ උපතින් වයස සියයක් සම්පූර්ණ වේ. වයස 22 දී 1936 වසරේ මැයි 06 වන දින පැවිදි බවට පත්ව මේවන විට 77 වසරක් ස්වකීය නිර්වාණ අවබෝධය සඳහා ජීවිතය කැපකොට උන්වහන්සේ වටහාගත් ධර්මය තුලින් ලක්වැසි ලක්ෂ සංඛ්‍යාත බොදු බැතිමතුන්ට දහම් වහරේ වස්වා දැනට වයෝවෘද්ධව තමන් වහන්සේ පෝෂණය කළ සසුන් දරු බුදු පුතුන් ගේ උපස්ථාන ලබමින් මහරගම ධර්මායතනයේ වැඩ සිටින සේක. පැළෑණේ ශ්‍රී වජිරඥාන මහානායක මාහිමියන් ගේ ශිෂ්‍යයකු ලෙස ආදරයට ගෞරවයට පාත්‍ර වූ රාහුල මාහිමියන් ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය සමත්ව තරුණ වයසේම පැවිදිව මුළු ජීවිතයම සසුනට කැපකොට භික්ෂු ශීලය දිවි දෙවැනිකොට රැකගත් බව මම ප්‍රත්‍යක්ෂයෙන්ම වටහාගෙන ඇත්තෙමි.

1948 වසරේ මිරිස්ස ගල්කඩුව වත්තේ කුටියක වස්වසමින් වැඩ සිටි සමයෙහි මාස 3කට වැඩි ඒ

වස්කාලය තුළ උන්වහන්සේ මිරිස්ස ද්විභාෂා මිශ්‍ර පාසැලේදී සතිපතා පැවැත්වූ ධර්ම දේශනා ඇසීමට මට ලැබුණු අවස්ථාව කිසිවිටෙක අමතක නොවේ. වස් කාලය ආරම්භයේම දේශනා අසන පාසල් සිසුදරුවන් අයත්වන පන්ති හා වයස් අනුව කණ්ඩායම් 03 කට බෙදා ධර්මය ඇසීමට සලස්වා අවසන පරීක්ෂණයක් පවත්වා ධර්මඥානය විමසන බවට උන්වහන්සේ පැවසූ සේක. ඒ අනුව ඇතිකළ කණ්ඩායම් 03න් ඉහල කණ්ඩායමට මම අයත් වීමි. අවසානයේ කළ ලිඛිත පරීක්ෂණයෙන් පළමු තැන හිමිකර ගත් මට ගුරුළුගෝමි පඬිතුමාගේ 'අමාවතුර' පොත පරිත්‍යාගයක් වශයෙන් ප්‍රධානය කොට පැවසූයේ එම පොත බී.ඒ. විභාගයට අවශ්‍ය විය හැකියයි කියා ය. එම පොත බී.ඒ. විභාගයෙන් පසු ඇම්. ඒ. සිංහල විභාග යට නිර්දේශ ග්‍රන්ථයක් විය.

උන්වහන්සේ සියලුම ධර්මදේශනා ගැන සටහන් තබාගෙන පසුව නැවත ලියා පොතක් සේ පිළියෙල කොට කවරයට චිත්‍රයක් ද අන්දවා වස් අවසානයේ පිරිනැමීමට හැකිවීම මා සතුටින් සිහිකරන අතර උන්වහන්සේ ගේ අතින් ලබාගත් අමාවතුර ග්‍රන්ථය ආදරයෙන් අදත් මම ආරක්ෂා කර රැක ගන්නා බව පවසමි.

සාම්ප්‍රදායික ධර්ම දේශනා විලාසය වෙනස් කොට හෘදයංගම ශෛලියකින් දේශනා පැවැත්වීමට උන්වහන්සේ ප්‍රවීණත්වයක් ලබා ගත්තේ සිය ගුරු දේව පැළෑණේ වජ්‍රඥාන මහානායක මාහිමියන් ඇසුරෙනි. බෞද්ධ ජීවිතයට අවශ්‍ය දහම් දැනුම දහම්නයින් ගාථා, ධර්ම කථා, අලුතින් පබඳින ලද සරල කවි යොදා පැවැත්වූ දේශනා හදවතට අමතන නිවැරදි දහම් පණිවුඩයක් දීමට

පොහොසත් විය. 1949 වසරේ ඇසූ ධර්ම දේශනාවල හරය වටහා ගෙන නව ජීවිත දැක්මක් ගොඩනගා ගැනීමටත් පසුව රජයේ සේවයේ යෙදී සිටියදී එම දැනුම තුළින් නිවැරදි සේවයක් ඉටුකිරීමට හැකිවීමත් මා සිහිපත් කරන්නේ බලවත් සොම්නසිනි. කෘතවේදිත්වයෙනි. පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමි, පූජ්‍ය පණ්ඩිත මිරිස්සේ ගුණසිරි මාහිමි වැනි ශික්ෂාකාමී භික්ෂූන්වහන්සේලා ගේ ඇසුරද නිවැරදි දිවි පෙවෙතක් ගොඩනගා ගැනීමට උපකාරි වූ බව සඳහන් කරමින් පූජ්‍ය අම්පිටියේ රාහුල මාහිමියන්ගෙන් මා ලද ධර්ම පෝෂණය ගැන අවස්ථා දෙකක් පමණක් මෙහිලා සඳහන් කරමි.

1974-75 අධ්‍යයන වර්ෂයේ කොළඹ ක්‍රමය යටතේ ශිෂ්‍යත්වයක් ලැබ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබද්දී මා ගැන දැනසිටි එම විශ්වවිද්‍යාලයේ සමයාන්තර දර්ශනය ගැන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලාන්ස් කසින් මැතිතුමා නිසා බෞද්ධ දේශනවලට ආරාධනා ලැබ ඒවා පැවැත්වීමට යෑමට සිදුවිය.

ඉන් එක් අවස්ථාවක් වූයේ ලැන්කැස්ටර විශ්වවිද්‍යාලයේ දි මා ඉංග්‍රීසියෙන් පැවැත් වූ දේශනාව යි. Seeing the Buddha from the Dhamma එහි මාතෘකාව විය. ආරාධනාවෙන් පසු මැය තෝරාගත්තේ ඒ ගැන මගේ මතකයේ සටහන්ව තිබූ දහම් දැනුම නිසා ය.

**''බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං**
**කප්පම්පි චේ අඤ්ඤ'මභාසමානෝ**
**ඛීයේථ කප්පො චිර දීඝ'මන්තරෙ**
**වණ්ණො න ඛීයේථ තථාගතස්ස''**

තවත් බුදුවරයකු කපක් මුළුල්ලේ කියාත් නිම කළ නොහැකි බුදුගුණ සම්භාරයක් බුදුරදුන් තුළ පැවැති බව මුලින් ම මා අසා දැනගත්තේ 1949 වසරේ රාහුල මාහිමියන් පැවැත්වූ ධර්ම දේශනාවක් තුළිනි. ''**යෝ ධම්මං පස්සති සො මං පස්සති**'' යමෙක් දහම් දකී නම් හේ මා දකී යයි ධර්මය තුළින් ම බුදුන් දැකීමට බුදුන් වහන්සේ උපදෙස් දුන් අන්දම පූජ්‍ය අම්පිටියේ රාහුල මාහිමියන් ගෙන් දැන ගතිමි.

උන්වහන්සේ ගේ ධර්මදේශනා විලාසය සරල විය. හෘදයංගම විය. ආදර්ශවත් විය. එම නිසා අසන්නාට එය නොමැකෙන සේ සිත්හි දරාගෙන ඒ අනුව පැවැත්මට අනුබලයක් විය. 1972 වසරේ සංස්කෘතික දෙපාර්තමේන්තුව පළකළ ''භාවනා'' මාසික සංග්‍රහයට මේ මාහිමියන් සැපයූ ලිපිය උන්වහන්සේ දැඩිව රැකගත් ශීල සම්පත්තිය ප්‍රකාශවන සාරවත් විවරණයක් විය. එම ලිපියේ මාතෘකාව ''ශීල විපත්තියෙහි ආදීනව හා ශීල සම්පත්තියෙහි ආනිශංස'' යන්නයි.

සිල්වත් නොවී සිට සැදැහැවතුන් පිරිනමන සිව්පසය පරිභෝජනයෙහි බලවත් විපාක විස්තර කරමින් සිල්වත් බවේ ආනිශංස එම ලිපියෙහි දක්වා ඇත්තේ මෙසේ ය. ''ශීලය කුශල ධර්ම ජනිත කරවන බිජුවටකි. ගුණ ධර්ම නැමැති රත්නයන්ගෙන් පිරුණාවූ දියමන්ති ඔරුවකි. බොහෝ ආදර සැලකිලි නමැති මීමැසි සමූහයාගෙන් ගැවසීගත් මල් පොකුරකි. සිල්වතුනට සකල ලෝකයා බුහුමන් කරන බව මෙයින් අදහස් කරනු ලැබේ.''

''යමෙකු ගේ ශීලය නිර්මල වන්නේ ද ඔහුගේ පාත්‍ර සිවුරු දැරීමත් ප්‍රසාද ජනක වන්නේ ය''

මෙහි දක්වන ලද සිල්වත් පැවිදි දිවියක ගුණාංග අම්පිටියේ රාහුල මාහිමියන් තුළින් නිරතුරුව ප්‍රදර්ශනය විය. ඉංග්‍රිසි සිංහල බසින් පවත්වන ලද දේශනා හා ලිපි සංඛ්‍යාව විශාල විය.

එම ලිපිවල ඇතුළත් ලිපි 22ක් අඩංගු 'භාවනා' වෙසක් සංග්‍රහය ඉංග්‍රීසි බසට පරිවර්තනය කරද්දි එයට යෙදූ මැය වූයේ Consequences of decline in Sila and the advantages of endowment with Sila යන්න ය. එම සංග්‍රහයට අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන් හා පූජ්‍ය නාරද මාහිමියන් ද ලියූ තවත් ලිපි දෙකක් ඇතුළත් වේ.

වජිරාරාම විහාරයෙන් සිදු වූ හා සිදුවන උදර ශාසනික මෙහෙවරේ මහා පහන් ටැඹක් බඳුව, අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන් සමඟ මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය බිහි කොට එහි එළිය වඩාත් සුවියත් කොට දැල්වූ අපගේ උතුම් කල්‍යාණමිත්‍ර ආචාර්ය පූජ්‍ය අම්පිටියේ රාහුල මාහිමියන්ට තෙරුවන් සරණින් නිදුක් නිරෝගී සුවය බැතිසිත් පෙරදැරිව පතමි.



# ආදරයේ දයාදය

'මුතු සීයා' විසිනි

තරුණ කුඹල් කරුවකු වූ කෝලිත දක්ෂ කලා කරුවෙක් ද වීය. ඔහුට දව ඔහු ගේ බිරිඳට යහපත් දරු දෙදෙනෙක් ද වූහ. එක් රාත්‍රියක මොවුන් ගේ වැඩිමහල් පුතුට දරුණු බඩේ රුදවක් වැළඳිණි. එහෙත් පුතු ගේ රෝගය සාමාන්‍ය බඩේ අමාරුවක් ලෙස සලකමින් කෝලිතවත් ඔහු ගේ බිරිඳවත් ඒ ගැන වැඩි උනන්දුවක් නො දැක්වූහ. එහෙත් ඔහුට වැළඳ තිබුණේ තියුණු අපෙන්ඩිසයිටිස් රෝගය නිසා එදු රෑ ම ඔහු මිය ගියේ ය.

රෝගයේ දරුණු බව මුල දී අවබෝධ කර ගත්තේ නම් දරුවා ගේ මරණය වළක්වා ගන්නට තුබූ බව වැටහීමෙන් තමන් ගෙන් සිදු වූ ප්‍රමාදය ගැන ඇති වූ පශ්චාත්තාපයෙන් කෝලිත ගේ මානසික සුවතාව දිනෙන් දින පිරිහෙන්නට විය. කල් යාමේ දී ඔහුගේ තත්ත්වය වඩාත් බරපතළ වූයේ සය හැවිරිදි බාල දරුවා තමනට පවරා ඔහු ගේ බිරිඳ තමන් අත් හැර ගිය හෙයිනි. මේ කරුණු දෙක නිසා ඔහුට ඇති වූ වේදනාව සහ ශෝකය හේතුවෙන් මත්දියර භාවිතයට ඇබ්බැහි වූයේ එයින්

කිසියම් හෝ සහනයක් ලද හැකි වෙතැයි සිතූ හෙයිනි. එහෙත් කල්යාමේ දී ඔහු බේබද්දෙක් වීය.

මේ හේතුවෙන් තමන් සතු ව තුබූ නිවස, ඉඩකඩම්, බඩු මුට්ටු සහ කලා කෘතීන් ආදී සියල්ලම ඔහුට අහිමි විය. අවසානයේ දී ඔහු අවුණු හලක කාමරයක හුදෙකලාව අවසන් හුස්ම හෙළා ඇති බව ඔහු ගේ මිතුරනට දැන ගන්නට ලැබුණි.

මත්දියරට ඇබ්බැහි වූවකුට මෙ වැනි අවසාන ඉරණමක් උද වීම සාමාන්‍ය සිදු වීමකි. එය අරුමයක් නොවේ. ඔහු බීමත්කමින් දිළිඳු බවට පත් වැ ජීවිතය විනාශ කර ගත් තවත් අයෙක් පමණෙකැයි කෝලිත ගේ මිත්‍රයකු සුපුරුදු තීරණයට එළඹී ය.

බීමත්කමින් අවාසනාවන්ත ඉරණමක් අත් කර ගත් තවත් පුද්ගලයකු යයි කෝලිත ගේ කතන්තරය එම මරණයෙන් අවසන් කෙරුමට කෝලිත ගේ මිතුරාට නොහැකි වූයේ ය. ඒ ර්ට වසර කිහිපයකට පසු කෝලිත සමග ජීවත් වූ ඔහු ගේ බාල පුත් අර්නි අහම්බෙන් ඔහුට හමු වූ හෙයිනි. ඔහු තෘප්තිමත් සැපවත් ජීවිතයක් ගත කරන බව බැලූ බැල්මට ම පෙනුණි. මිතුරා ගේ පුතා ගැන කලියෙන් සොයා නොබැලීමේ වරද සිතෙහි කැකෑරුණ ද සිතට ධෛර්යය ගෙන ඔහු මෙසේ විමසී ය.

'ආච්, කොහොමද පුතා අර්නි, තාත්තා ගේ මළගමින් පස්සේ දැක්කෙත් නැහැ. සෙව්වෙත් නැහැ. අපේ ම වරද තමයි දැන් දරුපවුලුත් වෙලා නේ ද?'

හිතේ අමාරුවට බීලා බීලා තාත්තා මැරුණත් තාත්තා

නරක මිනිහෙක් නෙවි, බේබද්දෙක් නෙවි. වයස දහඅටේ දී තාත්තා අත හැරලා මා යන තෙක් ම තාත්තා මට සෙනෙහස දැක්වූවා. ඒ දවස්වල සෑමදම රෑට මගේ කාමරයට එන තාත්තා, මට උණුසුම් හාදුවක් දී, පුතේ මම උඹට ගොඩක් ආදරෙයි කියා තුරුලු කර ගෙන ඉඳලයි යන්නේ යි පවසා අර්නි දිග සුසුමක් හෙළුවේ ය. තාත්තා මට ඉතිරි කොට තබා ගිය දායාදය එය යි.

මිතුරා ගේ දෙනෙත් කඳුළුවලින් තෙත් වුණි. ඔහු ගැන මා කෙතරම් වැරදි සහගත ඇගයීමක් ද කර තුබුණේ ? ඔහු භෞතික වස්තූන් දායාද වශයෙන් ඉතිරි කොට තබා නො ගිය ද, ඉතා ම වටිනා දායාදයක් වූ ආදරය තම පුතුට හිමි කොට ගොස් තිබිණි.

**''අදන්ත දමනං දානං - දානං සබ්බත්ථ සාධකං**
**දානේන පියවාචාය - උන්නමන්ති නමන්ති ච''**

දානය හෙවත් දීම වනාහි නොහික්මුණවුන් හික්මවන හැම අදහස් (උසස් බලාපොරොත්තු) සිදුකර දෙන මහගු ගුණයෙකි. දීමෙනුත් ප්‍රියවචනයෙනුත්, දෙන ඇත්තෝ ද ප්‍රිය වචන කථා කරන්නෝ ද උසස් වෙති. මේ දෙකෙන් සංග්‍රහ ලබන්නෝ සංග්‍රහා කළ අයට නැමෙති. හෙවත් අවනත වෙති.



# ගුරු දෙව් බැති සරණිය

**බම්බලපිටියේ සිරි වජිරාරාමවාසී ත්‍රිපිටකාචාර්ය**
**පූජ්‍ය වේරදූවේ මහින්ද හිමිපාණන් විසිනි**

| | |
|---|---|
| අතහැර යොවුන් විය පැහැපත් කමින් | බර |
| පින්බර පැවිදිබව ලැබ කර සිත් | අදර |
| දුරුකර අගුණ තැන් මතුකර නිවන් | දෙර |
| පින්සර පැවිදි රුවනක් විය ගුණෙන් | බර |
| | |
| සතහට සැදැහැ උපදින ලෙස දෙසූ | දහම |
| මනහර සරල බසකින් යුතු විය | සුගම |
| ගහකොළ සිරිය වෙත සිත් බැඳි හැම | දිනම |
| එලෙසින් කුලුණු බර විය අප හට | බොහොම |
| | |
| විටෙකදි රළුව විටෙකදි කුලුණින් | අපට |
| ඔවදන් දෙමින් යහමඟ පෙන්වා | යසට |
| නොපහන් පහන් දනමන සකසා | පිනට |
| මෙහෙවර අමිල වෙයි නිහඬව කළ | ලොවට |
| | |
| පුන්සඳ විලස ගුණයෙන් දිදුලන | නිබඳ |
| පියුමක් විලස පතුරන නිති සිල් | සුවඳ |
| සියවන වසර සමරන ගුරු දෙව් | සමිඳ |
| පතනෙමු දිගාසිරි කර ගරු සරු | නොමඳ |



# ගස් සිසිල බෙදනවා, අපි ගස් සුරකිනවා

**ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර**
**චින්තා කොස්සින්න මහත්මිය විසිනි**

මගේ නම අමා. මම හොඳ බෞද්ධ ළමයෙක් කියා සීයා කියනවා. ආසාවෙන් දහම් පාසල් යන්නේ හොඳ ළමයෙක් නේ ? දහම් පාසල් ගුරුතුමිගේ නම තමයි ''මිස් සිරින්සූරිය'' ඒක දිග නමක්. ඒ නිසා මම කැමතියි එයාට නිකම්ම ''මිස්'' කියන්න.

අද විශේෂ දවසක්. අද දහම් පාසලේ අපිට චිත්‍රපටියක් පෙන්නුවා. ඒ නිසා අද අපිට අකුරු ලියන්න තිබුණේ නැහැ. මම නම් ඒකට කැමතියි. ඇයි දන්නව ද? අද අපිට ලියන්න තිබුණේ හරිම බරපතළ අකුරක්. සුදු සීයා ඒවගෙ බරපතළ අකුරු තියන වචන කියනවා. ඒවා පිරිත්. අපි උදේට නම් පිරිත් අහනවා හැමදම. ඉතින් ඔන්න ප්‍රධාන ශාලාවේ ජනෙල් තිර රෙදිවලින් වැහුවා. ශාලාව අඳුරු උණාම පැහැදිලිව රූප පෙනෙනවා කියලා මිස් කිව්වා.

ඒක අහිංසක ගහක් ගැන කතාවක්. ගහේ නම 'ශාක්‍ය'. ඒක රූස්ස ගහක්. ඒ කියන්නේ අතු පතර විහිදුණු විශාල ගහක්. ගහ තිබුණේ සෙල්ලම් පිට්ටනියක. ළමයි අව්වට වැස්සට හෙවණට යන්නේ මේ ගහ යටට. ගහේ කොළ සුළඟට හෙලවි හෙලවි හිනා වෙනවා.

මේ ගහේ කඳ කපලා විකුණුවොත් විශාල මුදලක් ගන්න පුළුවන් කියලා මාමලා දෙන්නෙක් කතා වෙනවා. ඒ මාමලා රජයේ නිලධාරි කෙනෙක් ළඟට ගිහින් ගහ කපන්න අවසර ඉල්ලනවා.

'ශාක්‍ය' වටේ කැරකෙමින් මාමලා මේ ගැන කතා වෙනකොට ශාක්‍යට හරිම දුකයි. එයාට වැඩියෙන් ම දුක පුංචි ළමයින්ට සැර අව්ව තියන වේලාවට හෙවණ දෙන්න බැරිවෙන එක ගැනයි. අවට ගස්වලටත් මේ බව ආරංචි උණා. ගස් ඔක්කොම දුකින් එහාට මෙහාට වැනෙනවා. ගස්වලින් කඳුළු බෙරෙනවා වගේ. මගේ අතටත් නොදැනිම කඳුළු බිංදුවක් වැටුණා.

ඔන්න පුංචි ළමයින්ටත් ගහ කපන බව ආරංචි උණා. ඒ ගොල්ලෝ ගහ වටේට වැටක් බැන්දා. නොයෙකුත් ආදර්ශ පාඨ ඒ වැටේ එල්ලුවා. ඒත් ගහට හානියක් වෙන විදිහට නම් වැඩ කළේ නැහැ. පුවරුවල තිබුණ දේවල් හරිම අපූරුයි.

'ගස් අපට හෙවණ දෙනවා'

'ගස් අපට පිරිසිදු වාතය ලබා දෙනවා'

'ගස් අපට ආදරෙයි'

'අපිත් ගස් නොකපා ගස් රැක ගනිමු. තව ගස් වවමු.'

ඔන්න ඉතින් ගස් කපන්න ආව මාමලා මේවා දැක්කා. රුස්ස ගහක් කපලා දම්මාම ඒ අඩුව දැනෙන්නේ ගහට නොවෙයි. අවට පරිසරයට. පරිසරයේ ජීවත් වෙන ඔයාලට අපිට.

පුංචි ළමයි එක හඬින් කිව්වා. ඉර වෙනදටත් වඩා දිලිසුණා. ගහ සර සර ගා කොළ අතු හෙලෙව්වා. මාමලාටත් අව් රස්නෙන් බේරෙන්න ශාක්‍ය ළඟටම එන්න සිදු උණා.

ඇත්ත තමයි, ගහ කපලා ලැබෙන සල්ලිවලට වඩා ගහේ හෙවණත් වටිනවා. මාමලා කතා උණා.

ළමයි ඔක්කොම සින්දුවක් කිව්වා.

ගස් සිසිල බෙදනවා. අපට සතුට දැනෙනවා. ගස් අපව රකිනවා. අපි ගස් සුරකිනවා.

මම එදා බස් රථයේ ගියෙත් ගයමින්. සුදු සීයා මා එනතුරු පාර අයිනේ බලාගෙන හිටියා. අම්මා වැඩට ගොහින් එනතුරු මාව බලා ගන්නේ සුදු සීයා. දහම් පාසල දවසටත් සුදු සීයා මාව බලන්න එනවා.

බස් එකෙන් බැහැලා මම සින්දුව කිය කියා, සීයා වටේට අස්සයා පැන්නා. මතක් වෙන වෙන විදිහට මම සීයාට කතාව කියා දුන්නේ නොඉවසිල්ලෙන්.

'ගස් වැල් ආරක්ෂා කරන්න කියලා බුදු හාමුදුරුවොත් දේශනා කරලා තියෙනවා. බුදු හාමුදුරුවන් නිර්වානය අවබෝධ කළෙත් ගහක් යට භාවනා කරමින් සිටිද්දීනේ ' සීයා කිව්වා.

ඒ මොකක්ද නිර්වාණය කියන්නේ ? ඒක මට තේරුණේ නැහැ. සුදු සීයා ඇස් දෙක කරකවලා සිලීම දිහා බැලුවා. මාත් බැලුවා . ඒත් මම නම් මුකුත්ම දැක්කේ නැහැ.

භාවනා කරලා සියලු බැඳීම්, ආසාවන් නැති කිරීමට තමයි නිවන කියන්නේ. අමාට දහම් පාසලේ පොඩි හාමුදුරුවන්ගෙන් අහගන්න පුලුවන් ' සීයා බරපතළ මූණක් හදාගෙන කිව්වා.

මම ආයෙමත් ගායනා කරමින් අස්සයා පැන්නා. ඒක හොඳ සෙල්ලමක්.

'ගස් සිසිල බෙදනවා. අපට සතුට දෑනෙනවා ..........

ගුරුන් කී ලෙස ම කන් දී අසන්නේ
ඇසූ ලෙස ම සිත්හීලා දරන්නේ
දැරූ ලෙස ම කටපාඩම් කරන්නේ
එ පාඩමින් පමණක් නොනවතින්නේ

පදයක් පාසාම අරුතුදු උගන්නේ
හැම පද පිඩු කොටත් අදහස සිතන්නේ
විමසා බලා තීරණයට බසින්නේ
මෙලෙසින් පැරැණියන් නෙ සතර උගන්නේ

මිනුත් නොනැවතී පත් පොත් බලන්නේ
නොයෙක් විසාහී දැනුමක් ලබන්නේ
කෙමෙන් මෙසේ තිස් වන විය ගෙවෙන්නේ
ඉනුත් පසු ය ගත් කරනට සිතන්නේ

- **අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහනාහිමි**
(බෞද්ධ ළමයා 1968 වෙසක් කලාබ)



# සියවසක සුපිපි කුසුම

නත්තල මැදියම සීනු නාද මැද
පිපුණු සුසුදු අරවින්දය හිමි සඳ
සසර පුරුදු ලෙස දුළවා පින් තෙද
සසුන'ඹරේ හිමි වූවා පුන් සඳ

විදුරු අරම් කිත් යසස් නගන්නට
මවු වත් සෙනෙහස් දයා සිතින්
බුදු පුතුන් තනා දම් මගෙහි යවන්නට
දුරු වෙහෙස කියමු ද කෙලෙසින්

ගුණ සුගන්දේ සුපුල් පියකරු
පියුම තුම් සාසන විලේ
සිරි රහල් මාහිමිඳු පින් කෙත
සිය වසක සුවඳින් දිලේ

- පුෂ්පා ජයවර්ධන



කෙටි කතාව

# මලක සුවඳ

සිරි වජිරාරාමවාසී පූජ්‍ය පිටිපන සාසනරතන
හිමිපාණන් විසිනි

බෝසත් සිඟිති දුවේ පුතේ මලක සුවඳ කෙටි කතාවේ අවසානයට යි අපි දැන් ළඟා වෙන්නේ. ලොවැ ඇති වුණ දා සිට එහි නොයෙකුත් විපර්යාස සිදු වුණා. මේ වනවිට මේ ලෝකයේ සිටින ජීවී පිරිස විශාල ගැටලුවකට මැදිවුණ බව ගියවර කලාපයෙන් කියැවුණා පුංචි ඔබට මතක ඇති. අද එතැන් සිට..........

අපේ මේ සියලු ප්‍රශ්න විසඳා ගන්නට කළ හැක්කේ වැරදි අඩුපාඩු අඩු සැමට ගරු කරන සැමට හොඳින් සලකන මිනිසුන්ගේ දුක හොඳින් හඳුනන ඒ දුකට පිහිට වන්නට හැකි අවංක සත්‍යවාදී කෙනෙක් අප හැමෝගේ ම නායකයා බවට පත් කර ගැනීම යි.

එවිට ඔහුට හැකිවෙයි අපට යුක්තිය අයුක්තිය විසඳා දෙන්නට. අපේ බොහෝ ගැටලු වලට හොඳ විසඳුම් එවිට ලැබෙයි. අපි නායකයාට අපගේ සුවඳැල් අස්වැන්නෙන් කොටසක් දෙමු. එවිට ඔහුට වෙනත් රැකියා කරන්නට අවශ්‍ය වන්නේත් නැහැ. ඔහුගේ එක ම වගකීම අපේ නඩු හබ විසඳා වැරදි කරුවන්ට දඬුවම් කර

යුක්තිය ඉටු කිරීම යි. නිවැරදි කරුවන්ට සෙත සලසා දීම යි.

සමිත පුතේ මේ විදිහට එදා ඒ පිරිස කතිකා කරගත්තා.

අපෙ හාමුදුරුවනේ දැන් මේ සිදුවෙන්නේ මේ ලෝකයේ නායකයෙක් ඇති වීම නේ ද?

බොහොම හොඳයි පුතාට එය දැන් හොඳට අවබෝධ වෙලා තියෙනවා..

මෙලෙස පිරිස අතර සිටි අයවලුන්ගෙන් ධීර වීර ගති ඇති බුද්ධිමත් සත්පුරුෂ අයෙක් ඒ අයගේ නායකයා බවට පොදු කැමැත්තෙන් පත් කර ගත්තා. හැමෝගේ ම පොදු කැමැත්තෙන් බිහිවුණු මේ නායකයාට "මහා සම්මත රජු" කියල ආමන්ත්‍රණය කළා.

ඔන්න ඔය විදිහටයි සමිත පුතේ බුදු දහමට අනුව මේ ලෝකයේ රජ කෙනෙක් පත් වුණේ. රාජ්‍යය බිහි වුණේ.

එතකොට බලන්න නායකයෙක් අන් අයට කෙතරම් ආදර්ශ සම්පන්න විය යුතු ද, ඔහු කෙතරම් වගකීම් ඇත්තෙක් ද, පොදු ජනයාට මොන තරම් සේවාවක් ඔහුගෙන් සිදු විය යුතු ද.

එහෙමයි හාමුදුරුවනේ මට හොඳට පැහැදිලි වුණා..

මෙතැනින් අග්ගඤ්ඤ සූත්‍රය අවසන් වෙනවා.....

කෙසේ නමුත්, මිනිසා නම් සත්ත්ව කොට්ඨාශයේ සතුන්ගේ සිත් තුළ තෙරපෙන අසීමිත ආශාවන් නිසා සීමිතව ඇති සොබාදහම සූරාකෑම සිදු වුණේ ලොවැ ආරම්භයත් සමගමයි කියල පුතාට පැහැදිලි කර දීම තමයි

මට අවශ්‍ය වුණේ. මේ කතාව පුරාවට මම විවිධ පැතිකඩ ඔස්සේ මේ කරුණු කියා දුන්නා. විස්තර කළා. ඒ වගේ ම තවත් ධර්ම කරුණුත් කියා දුන්නා......

කෑදර කමින් මසුරු කමින් ලොව ම තමන්ගේ කරගන්න යාමෙන් මේ වටිනා පරිසරය දවසින් දවස විනාශ මුඛයට පත් වෙනවා. මනුස්ස කමත් නැතිවෙනවා. මිනිසුන්ගේ ජීවිත වල තිරිසන් ගති ඉස්මතු වෙන්න පටන් ගන්නවා. අවසන මේ කුරිරු වූ දරුණු වූ ක්‍රියාකාරකම් නිසා මුළු ලොව ම විනාශ වෙලා යනවා.

සමිත පුතා, හොඳට අදිටන් කර ගන්න. මම පුංචි කාලේ ඉඳලා ම බුදු සමිඳු කියා දුන්න වටිනා ධර්ම මාර්ගයේ ම ගමන් කරනවා. ධර්මානුකූලව ම ජීවිතය හැඩගස්වා ගන්නවා. සමාජයේ දී අන් අයගෙ දෝෂ දර්ශනයට ලක්වෙන වැරදි කිසිවක් සිදු කරන්නෙ නෑ. ඒ වගේ ම ජීවිතය ගැන ආපසු හැරිල බලන විට සිත තුළ කනගාටුවක් පසු තැවීමක් ඇතිවන පාපී වැඩ කිසිවක් සිදු කරන්නෙත් නෑ. කවද හරි දවසක බුදු සමිඳුගෙ ළය මඩලින් උපන්න වටිනා දරුවෙක් බවට පත් වෙනවා. සුදු නෙලුමක් ව පිපිලා මුළු ලොව ම සුවඳවත් කරනවා....

බෝසත් දරුවනට මෙත් සිතින් ලියා දන්වන වග නම්, පුංචි දුවේ පුතේ තමන්ට ලැබුණ මිනිස් දිවියේ වටිනාකම අවබෝධ කරගෙන එයට හැම අතින් ම අර්ථයක් සිදු කර ගන්න....

......නිමි.....